# කාන්තාවන්ට සහ ගැහැනු දරුවන්ට එරෙහි අස්වාභාවික මරණ පිළිබඳ පුවත්පත් වාර්තාකරණය

## ගැටලුව

කාන්තාවන් හා ගැහැණු දරුවන් ස්වාභාවික නොවන ආකාරයෙන් මිය යන අවස්ථා පිළිබඳ පොදු ජනයාගේ සැකයට තුඩු දෙයි. තුවාල ලැබීම හෝ මානසික කම්පනය නිසා මරණය සිදු වන අවස්ථාවලදී හෝ මරණය සිදු වූ ආකාරය හෝ වාතාවරණය හේතුකොට ගෙන මිනීමැරුමක්, සිය දිවි නසා ගැනීමක් හෝ හදිසි අනතුරක් ඇඟවෙන විට හෝ මරණය සිදු වූ ආකාරය තීරණය කළ නොහැකි අවස්ථාවලදී විශේෂයෙන් ම මෙවැනි සැකසංකා ඇති වේ. එවැනි මරණ ගැන ප්‍රධාන වශයෙන් වාර්තා වන්නේ මාධ්‍ය මගිනි. විශේෂයෙන් ම පුවත්පත් වාර්තා මගින් හෙළිදරව් කරයි. වත්මන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකට අයත් ලියාපදිංචි පුවත්පත් 25 ක් පවතී (සිංහල 11, දෙමළ 5, ඉංග්‍රීසි 9). මාධ්‍ය ආවරණය කඩිනම් හා ගවේෂණාත්මක විය යුතු යැයි ද ස්වාභාවික නොවන මරණ සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කඩිනමින් වාර්තා කළ යුතු යැයි ද එවැනි මරණ වැළැක්වීම සම්බන්ධ අදහස් ප්‍රචලිත කළ යුතු යැයි ද අපේක්ෂා කෙරේ.

රට තුළ මාධ්‍ය - විශේෂයෙන් ම පුවත්පත් කලාවේදීන් - ක්‍රියාත්මක විය යුතු යැයි අපේක්ෂිත රාමු හා සීමාවන් කවරේ දැයි දණ්ඩ නීති සංග්‍රහය සහ රට තුළ පවත්නා අනෙකුත් නීති මගින් ද ආචාරධර්ම පද්ධති හා මාර්ගෝපදේශ මගින් ද සම්පාදනය කර ඇත. උදාහරණයක් ලෙස, ලිංගික හිංසනය, පැහැර ගෙන යාම, ළමා ලිංගික අපයෝජනය, ලිංගික දූෂණය හා ව්‍යභිචාරය, අස්වාභාවික වැරදි ක්‍රියා, බරපතල ලිංගික අපයෝජනය සහ දැඩි අසභ්‍යත්වය යන තත්වයන්ගේ වින්දිතභාවයට පත් වූවන් හඳුනා ගත හැකි තොරතුරු ප්‍රසිද්ධ කිරීම දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් පැමිණ විය හැකි වරදකි. එහෙත්, එය අදාළ නො වන අවස්ථා තුනක් පවතියි: එනම්, අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා හෝ විමර්ශනය භාර නිලධාරියා 'විමර්ශනයේ අරමුණු උදෙසා සද්භාවයෙන්' ක්‍රියා කරන්නේ නම් හෝ වින්දිතයාගෙන් ලිඛිත අනුමැතියක් ලැබී ඇත් නම් හෝ මිය ගිය පුද්ගලයාගේ සමීප ඥාතියෙකුගෙන් හෝ වින්දිතභාවයට පත් වූ බාල වයස්කාර හෝ සිහි විකල් පුද්ගලයෙකුගේ දෙමව්පියන්ගෙන්/භාරකරුගෙන් ලිඛිත අවසරයක් ලැබී ඇත්නම් එවිට ඉහත කොන්දේසියට යටත් නොවේ.[1]

> භාෂා තුනේ ම පුවත්පත් ආවරණය ගැටලු සහගත ය. සිංහල පුවත්පත්වල ස්වාභාවික නොවන මරණ බොහෝ විට වාර්තා කෙරෙන්නේ වාර්තාකරණයට අදාළ ආචාරධර්මානුකූල මාර්ගෝපදේශවලට හෝ පිළිගත් ආචාරධර්මානුකූල ප්‍රමිතීන්ට අනුකූලව නොවේ. සිංහල හා දෙමළ පුවත්පත්වල පළ වන සෑම මේ ආශ්‍රිත පුවතකදී ම පාහේ වින්දිතයන්ගේ නම් හා ලිපින සඳහන් කෙරේ. මේ නිසා ඔවුන් සහ ඔවුන්ගේ පවුල් අනාවරණය වන අතර ඔවුහු අසල්වැසියන්ගේ පමණක් නොව මුළු රටේ ම සැකයට හා අවධානයට ලක් වෙති. එසේ අනාවරණය වීම නිසා ඔවුන්ට අත්විඳීමට සිදු විය හැකි මානසික කම්පනය මුළුමනින් ම නොතකා හැරේ. චූදිත අපරාධකරුවෝ සහ සැකකරුවෝ ද නමින් ම සඳහන් කරනු ලබති. මේ නිසා වැරදිකරුවන් බවට ඔප්පු වීමට පෙර ඔවුහු ද සමාජයේ සුපරීක්ෂාවට හා පිළිකුලට ලක් වෙති. එපමණක් නොවේ. ලේඛන ශෛලිය, ඡායාරූපකරණය, ප්‍රධාන ශීර්ෂ පාඨ, වර්ණ ගන්වන ආකාරය, පුවත විස්තර කරන ආකාරය, හිස් ඉඩවල් තබන ආකාරය හා පුවත්පත තුළ ලිපි ස්ථානගත කරන ආකාරය අනුව පෙනී යන්නේ සිංහල පුවත්පත් බෙහෙවින් හැඟීම් අවුස්සන බවයි. වක්‍රෝක්තිය හා අලංකරණය නිසා තොරතුරු විකෘති වන බව ද සොයා ගෙන ඇත.

1 Penal Code (Amendment) [31 St October , 1995 ] <http://www.hrcsl.lk/PFF/LIbrary_Domestic_Laws/Legislations_related_to_Employment/Penal Code (Amendment) Act No 22 of 1995.pdf> [accessed 6 November 2017].

(ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල නීතිය අනුව) පුවත්පත් කලාවේදීන් සඳහා වූ ආචාර ධර්ම පද්ධතියේ ඇතුළත් වන නීති රීති[2] ප්‍රකාරව පුවත්පත් කලාවේදීන් වාර්තාකරණයට ලක් වන පුද්ගලයන්ගේ කීර්තියට හා පෞද්ගලිකත්වයට ගරු කළ යුතු යැයි ද ලිපිවල අන්තර්ගතය පිළිබඳව අදහස් දැක්වීමෙන් වැළකිය යුතු යැයි ද නියම කරයි. එමෙන් ම, ඔවුන් කවර හෝ සාපරාධී ක්‍රියාවක් හෝ හිතාමතා පැහැර හැරීමක් මගින් සත්‍යය විකෘති කිරීමෙන් වැළකිය යුතු යැයි ද මහජන රුචිකත්වය සහ සදාචාරය පිළිබඳ ප්‍රමිතීන් උල්ලංඝනය කරන හෝ ඒවා පහත් තත්වයට හෙළන තොරතුරු වාර්තා නො කළ යුතු යැයි ද අපේක්ෂා කරයි.

අපරාධයක වින්දිතභාවයට පත් වූ පුද්ගලයෙකුගේ හෝ අපරාධයක සාක්ෂිකරුවෙකුගේ හෝ අපරාධයක් පිළිබඳව තොරතුරු දැනුම් දෙන්නෙකුගේ හෝ අනන්‍යතාව ප්‍රසිද්ධ කිරීම සහ ප්‍රචලිත කිරීම මගින් ඔහුගේ හෝ ඇයගේ හෝ ජීවිතයට බලපෑම් කරන / ජීවිතය අනතුරේ හෙළන අයවලුන්ට එරෙහිව 2015 අංක 4 දරන 'අපරාධයක වින්දිතයින් හා සාක්ෂිකරුවන්ට සහාය වීම හා ඔවුන් ආරක්ෂා කිරීම පිළිබඳ පනත'[3] යටතේ නීතිමය පියවර ගත හැකි ය.



එහෙත්, මෙම නීතිමය ප්‍රමිතීන් හා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ තිබිය දීත්, **පුවත්පත් වාර්තාකරණයේ දී එදිනෙදා කරනු ලබන උල්ලංඝනයන්ට එරෙහිව බලධාරීන් ක්‍රියා කර ඇත්තේ කලාතුරකිනි.**[4]

මාධ්‍ය තුළ ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීම අසන්නන්ගේ, නරඹන්නන්ගේ හා පාඨකයන්ගේ හැසිරීම කෙරෙහි බලපෑ හැකි තරම පිළිබඳව ජාත්‍යන්තර මට්ටමේ විවාදයක් සිදු වෙමින් පවත්නා අතර නො එකඟතාවක් පවතී. ලොව පුරා විවිධ රටවල සිදු කර ඇති අධ්‍යයනයන් ගණනාවක සාක්ෂිවලින් පෙන්නුම් කෙරෙන්නේ බලපාන තරමෙහි විවිධත්වයක් ඇති බවයි.[5]

1994 දී පයික් සහ කොම්ස්ටොක් විසින් කරන ලද ද්විතීය මට්ටමේ විශ්ලේෂණයකින් අනාවරණය වූයේ මාධ්‍යය තුළ ප්‍රචණ්ඩත්වය අඛණ්ඩව නැරඹීම ද නො වැදගත් මට්ටමේ (සෙල්ලම් බඩුවලට එරෙහිව කරන අනුකරණාත්මක ප්‍රචණ්ඩ ක්‍රියා) සිට බරපතල මට්ටම (සාපරාධී ප්‍රචණ්ඩත්වය) දක්වා පැතිරෙන වඩාත් ඉහළ මට්ටමේ සමාජ විරෝධී හැසිරීම් ද අතර සම්බන්ධයක් පවත්නා බවයි. ගැටලුවලට විසඳුමක් ලෙස ප්‍රචණ්ඩත්වය පිළිගැනීම, සතුරු හැඟීම් වර්ධනය වීම සහ වෙනත් පුද්ගලයෙකු ගැන වේදනාවට පත් වීම නිසා ඇති වන ප්‍රතිඵල මීට අයත් වේ.



සිය දිවි නසා ගැනීම් වාර්තා කිරීම ප්‍රජාව තුළ කිසි යම් විධික්‍රමයකට අනුකූලව සහ යම් විශේෂිත කාල සීමාවකදී[6] සිය දිවි නසා ගැනීම් වැඩි වීම සමග සම්බන්ධ බවට (මෙය 'වර්ධර් බලපෑම'[7] යනුවෙන් හැඳින්වේ) වෛද්‍ය ලේඛනවලින් ලැබෙන සාක්ෂි එන්න එන්න ම වැඩි වෙමින් පවතී.

ශ්‍රී ලංකාව තුළ 1980 ගණන්වල මුල් අවධියේ සිට ස්වයං හිංසනයේ හා සිය දිවි නසා ගැනීමේ ක්‍රමයක් ලෙස කනේරු ඇට කෑම අනුකරණය කිරීමක් හා වැඩි වීමක් සිදුව ඇති බව පුවත්පත් වාර්තාවලින් පුළුල් ලෙස ඇඟවී ඇත.[8] කීර්තිමත් පුද්ගලයන් සිය දිවි නසා ගැනීම පිළිබඳ වාර්තා පදනම් කර ගෙන සූ එස්, චැන් වයි සහ කිම් එන් 2014 දී වාර්තා කරන්නේ සතියක් හෝ එවැනි කාලයක් තුළදී සිය දිවි නසා ගැනීමේ අනුපාතිකයන් පොදුවේ වැඩි වීමක් සිදුව ඇති බවයි.[9]



'පැපජිනෝ බලපෑම' යනුවෙන් හැඳින්වෙන සිය දිවි නසා ගැනීමේ සංකල්පය වැළැක්වීම සඳහා ජනමාධ්‍ය ද යොදා ගත හැකි බවට ලැබෙන සාක්ෂි වැඩි වෙමින් පවතී.[10] [11] [12] [13]

මේ වන විට ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සිය දිවි නසා ගැනීම් වාර්තා කිරීමට අදාළව විශේෂිත මාර්ගෝපදේශ ප්‍රවර්ධනය කරමින් සිටී. ඒවා සැලසුම් කරනු ලබන්නේ සිය දිවි නසා ගැනීමේ සංකල්පය ඇති වීම වැළැක්වීම හා අධෛර්යවත් කිරීම පිණිස ය.[14]

---

2 'Ethics Code | Sri Lanka Working Journalists Association' <http://www.slwja.lk/ethics.php> [accessed 6 November 2017].
3 'Assistance to and Protection of Victims of Crime and Witnesses Act,, No. 4 OF 2015' <http://www.srilankalaw.lk/gazette/2015_pdf/4 of 2015.pdf> [accessed 6 November 2017].
4 Huesmann LR, Taylor LD. The Role of Media Violence in Violent Behavior. Annu Rev Public Health. 2006;27(1):393-415. doi:10.1146/annurev.publhealth.26.021304.144640.
5 Cantor J. Media violence. In: Journal of Adolescent Health. Vol 27. ; 2000:30-34. doi:10.1016/S1054-139X(00)00129-4.
6 Niederkrotenthaler T, Herberth A, Sonneck G. The "Werther-effect" legend or reality?] Neuropsychiatr. 2007;21(4):284-290.
7 Chen Y-Y, Chen F, Yip PSF. The impact of media reporting of suicide on actual suicides in Taiwan, 2002-05. J Epidemiol Community Heal. 2011;65(10):934-940. doi:10.1136/jech.2010.117903.
8 Eddleston M, Ariaratnam CA, Meyer WP, et al. Epidemic of self-poisoning with seeds of the yellow oleander tree (Thevetia peruviana) in northern Sri Lanka. Trop Med Int Heal. 1999;4(4):266-273. doi:10.1046/j.1365-3156.1999.00397.x.
9 Suh S, Chang Y, Kim N. Quantitative exponential modelling of copycat suicides: association with mass media effect in South Korea. Epidemiol Psychiatr Sci. 2015;24(2):150-157. doi:10.1017/S204579601400002X.
11 Niederkrotenthaler T, Voracek M, Herberth A, et al. Role of media reports in completed and prevented suicide: Werther v. Papageno effects. Br J Psychiatry. 2010;197(3):234-243. doi:10.1192/bjp.bp.109.074633.
12 Sisask M, Värnik A. Media roles in suicide prevention: A systematic review. Int J Environ Res Public Health. 2012;9(1):123-138. doi:10.3390/ijerph9010123.
13 Niederkrotenthaler T, Reidenberg DJ, Till B, Gould MS. Increasing help-seeking and referrals for individuals at risk for suicide by decreasing stigma: The role of mass media. Am J Prev Med. 2014;47(3 SUPPL. 2). doi:10.1016/j.amepre.2014.06.010.
14 WHO | Preventing suicide: a resource for media professionals - update 2017. WHO. 2017. http://www.who.int/mental_health/suicideprevention/resource_booklet_2017/en/. Accessed November 6, 2017

## ස්වාභාවික නොවන මරණයක් යනු කුමක් ද?

ස්වාභාවික නොවන මරණයක් යනු රෝගයක හෝ වයස්ගත වීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු නොවන සහ තුවාල ලැබීම හෝ මානසික කම්පනය හෝ වස දීම වැනි බාහිර හේතුවක් නිසා ඇති වන මරණයකි. මිනීමැරුමක්, සිය දිවි නසා ගැනීමක්, හදිසි අනතුරක් හෝ නිශ්චය නො කරන ලද හේතුවක් යන ආකාරවලින් සහ වාතාවරණයන් තුළ එවැනි මරණයක් ඇති විය හැකි ය.

## අධ්‍යයනය පිළිබඳව

2015 දෙසැම්බර් මස UNFPA සංවිධානය ශ්‍රී ලංකාව තුළ සිදු වන ස්වාභාවික නොවන කාන්තා මරණ පිළිබඳව ජාතික අධ්‍යයනයක් සිදු කරන ලෙසත් එහිදී පහත දැක්වෙන අරමුණු පෙරදැරි කර ගන්නා ලෙසත් උපදෙස් දුන්නේ යː

(අ) තෝරා ගත් ශ්‍රී ලාංකික පුවත්පත් තුළ වාර්තා වන කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ ස්වාභාවික නොවන මරණ ආශ්‍රිත රටාවන්, තුවාල සිදු වූ ආකාරයන් සහ සාධක විමසා බැලීම,

(ආ) ස්වාභාවික නොවන මරණ පිළිබඳව පුවත්පත් මගින් සිදු වන ආවරණය විස්තර කිරීම, සහ

(ඇ) ආචාරධර්මානුකූල පුවත්පත් වාර්තාකරණය උදෙසා ප්‍රතිපත්තිමය යෙදවුම් හා මාර්ගෝපදේශ සම්පාදනය කිරීම.

ඒ ඒ පුවත්පත් තෝරා ගනු ලබන්නේ ජාතික ආවරණය පදනම් කර ගනිමිනි. සිංහල පුවත්පතක් නම් පිටපත් 150,000ක් ද දෙමළ පුවත්පතක් නම් පිටපත් 120,000ක් ද ඉංග්‍රීසි පුවත්පතක් නම් පිටපත් 88,000ක් ද සංසරණය විය යුතු ය.

ලංකාදීප

வீரகேசரி

Daily News

**2016 සැප්තැම්බර් සිට 2017 මාර්තු දක්වා වූ හය මාසයක කාලය තුළ ස්වාභාවික නොවන මරණ වාර්තා කළ පුවත්පත් ලිපි සමීක්ෂණය කිරීම**

අධ්‍යයනය සඳහා යොදා ගත් පුවත්පත්

| 88 | 31 | 33 |
|---|---|---|
| සිංහල ලිපි | දෙමළ ලිපි | ඉංග්‍රීසි ලිපි |

දෘශ්‍ය පෙනුම, භාෂාව සහ කරුණුවල සත්‍යතාව, පළ කර තිබෙන මතය, යොදා ගෙන ඇති අලංකරණ, චිත්තවේගීමය ස්වභාවය හා උද්වේගකරබව කෙරෙහි අවධානය යොමු කරමින් පුවත්පත් කලාවේදීමය රාමුවක් යොදා ගනිමින් මෙම ලිපි තව දුරටත් අධ්‍යයනය කරනු ලැබිණ. අනතුරුව පුවත්පත් තුනෙන් ලබා ගත් ලිපි 152 අන්තර්ගතයේ ගුණාත්මකත්වය විමසා බැලීම සඳහා තේමා පදනම් කර ගනිමින් විශ්ලේෂණය කරන ලදි.

"ශ්‍රී ලංකාවේ තෝරා ගත් පළාත් පහක කාන්තාවන් අතර සිදු වන ස්වාභාවික නොවන මරණ පිළිබඳව කෙරෙන අතීතාවලෝකනාත්මක, සවිස්තරාත්මක අධ්‍යයනය" නමින් සිදු කරන ලද සමාන්තර අධ්‍යයනයක් සඳහා වින්දිතයන්ගේ ඥාතීන් සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවලින් සපයා ගත් සාක්ෂි යොදා ගෙන සමහර දත්ත සසඳා බලන ලදී.

ඉංග්‍රීසි වාර්තාකරණය කෙටි සහ 'පොලිස් වාර්තාවලට' සීමා විය. සාමාන්‍යයෙන් ඉංග්‍රීසි පුවත්පත් ලිපි සමන්විත වූයේ වචන 50-100 අතර සංඛ්‍යාවකිනි. කෙසේ වුව ද, සිංහල සහ දෙමළ පුවත්පත්වලදී එය වචන 100 සිට පිටු භාගය දක්වා පරාසයක පැවතිණ. අධිකරණමය විමර්ශන ඇසුරින් රැස් කර ගත් තොරතුරු නිසා සිංහල ලිපි දීර්ඝ විය. විමර්ශන නිලධාරීහු ඔවුන්ගේ නම්වලින් හා නිල ලාංඡනයේ සඳහන් අංකවලින් හඳුන්වා තිබුණහ. ඉංග්‍රීසි ලිපි පාඨකයන්ට ස්වාධීනව නිගමනවලට එළඹිය හැකි වන පරිදි තොරතුරු සම්පාදනය කළේ ය. එහෙත් සිංහල හා දෙමළ ලිපි අදාළ පාර්ශ්වයන්ගෙන් ලබා ගත් ප්‍රකාශ හා ඔවුන්ගේ මත ඉදිරිපත් කර තිබිණ.

## වැදගත් සොයාගැනීම්



## පුවත්පත් වාර්තා අනුව වර්ග කිරීම




### හදිසි අනතුරු වර්ග පිළිබඳ විශ්ලේෂණය

| | මාර්ග අනතුරු | දුම්රිය අනතුරු | පිලිස්සීම | තෙරපීම් තුවාල | වෙනත් |
|---|---|---|---|---|---|
| සිංහල | 34 | 7 | 4 | 4 | 5 |
| ඉංග්‍රීසි | 13 | 1 | 1 | - | 1 |
| දෙමළ | 4 | - | - | - | 1 |
| මුළු ගණන | 51 | 8 | 5 | 4 | 7 |

හදිසි අනතුරු අතර වඩාත් ම පොදුවේ වාර්තා වන්නේ මාර්ග අනතුරු නිසා ඇති වන මරණ ය.

### සිය දිවි නසා ගැනීම් වර්ග පිළිබඳ විශ්ලේෂණය

| | එල්ලී මිය යාම | ගිනි තබාගැනීම | දියේ ගිලීම | වෙනත් |
|---|---|---|---|---|
| සිංහල | 4 | 1 | - | 3 |
| ඉංග්‍රීසි | 3 | 1 | - | 1 |
| දෙමළ | 5 | - | 2 | - |
| මුළු ගණන | 12 | 2 | 2 | 4 |

සිය දිවි නසා ගැනීම් අතර වඩාත් ම පොදුවේ වාර්තා වන්නේ ගෙල වැළලා ගැනීම/එල්ලී මිය යාම නිසා ඇති වන මරණ ය.

### මිනීමැරුම් වර්ග පිළිබඳ විශ්ලේෂණය

| | ගෙල මිරිකීම | තියුණු ආයුධ | මොට ආයුධ | පිළිස්සීම | වෙඩි තැබීම | වෙනත් |
|---|---|---|---|---|---|---|
| සිංහල | 3 | 11 | 2 | 1 | 2 | 3 |
| ඉංග්‍රීසි | 1 | 1 | 2 | - | 1 | 2 |
| දෙමළ | 6 | 2 | 3 | 2 | - | 4 |
| මුළු ගණන | 10 | 14 | 7 | 3 | 3 | 9 |

මිනීමැරුම් අතර වඩාත් ම පොදුවේ වාර්තා වන්නේ තියුණු ආයුධ භාවිතය නිසා ඇති වූ මරණ ය.

### අපරාධකරුවාගේ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ විශ්ලේෂණය




### අපරාධකරුවා සම්බන්ධ විස්තර පිළිබඳ විශ්ලේෂණය



- හඳුනා නො ගත් මරණ නො සලකා හරිමින් පුවත්පත් වාර්තා සියල්ල ම පාහේ වින්දිතයින් ඔවුන්ගේ සම්පූර්ණ නම් හා ලිපිනවලින් හඳුන්වා දුන් අතර පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා හෝ විමර්ශනය භාර නිලධාරියා ද නමින් සඳහන් කළේ ය. පුවත්පත් කලාවේ පුරුද්දක් ලෙස මුද්‍රිත මාධ්‍ය දණ්ඩ නීති සංග්‍රහයේ ඇතුළත් ව්‍යතිරේඛයන් නැවත නැවතත් වරදවා වටහා ගන්නා බව පෙනේ. එම ව්‍යතිරේඛයන්ගෙන් අවසර ලැබෙන්නේ 'විමර්ශනය සිදු කරන පොලිස් ස්ථානය විසින් හෝ එම පොලිස් ස්ථානයේ නියෝගය යටතේ' වින්දිතයන් හඳුනා ගැනීමට පමණකි. මින් අදහස් වන්නේ වින්දිතයන්ගේ නම් සහ ලිපින ප්‍රසිද්ධ කළ හැකි වන්නේ ඒ සම්බන්ධ වගකීම පොලීසියට පැවරිය හැකි තාක් දුරට පමණක් බවයි. වින්දිතයින්ගේ අනන්‍යතාව ප්‍රසිද්ධ කිරීමේදී පොලීසිය 'විමර්ශනයේ අරමුණු උදෙසා සද්භාවයෙන් ක්‍රියා කළ යුතු ය' යන කොන්දේසිය නොතකා හරින බවක් පෙනේ.

- මේ අයුරින් ම වරදකරුවා හෝ වගකිව යුතු පුද්ගලයා පිළිබඳ විස්තර ද දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත්වලට වඩා නිරතුරුව සිංහල පුවත්පත්වල වාර්තා වේ.

- පොලිස් විමර්ශන සම්පූර්ණ කර නැති තත්වයන් තුළදී පවා සිය දිවි නසා ගැනීම් හා මිනීමැරුම් වාතාවරණයන් හා සම්බන්ධ බොහෝ පුවත් වාර්තාවල ඒවාට දායක වූ සාධක පිළිබඳ නිගමන අන්තර්ගත වේ. ඇත්ත වශයෙන් ම, හේතු අපැහැදිලි සිය දිවි නසා ගැනීම් හා වෙනත් පිළිබඳ වාර්තා නැති තරම් ය.

- බොහෝ විට විශේෂයෙන් ම සිංහල පුවත්පත් ලිපියක උද්වේගකර ශීර්ෂ පාඨය සහ අන්තර්ගතය අතර පැවතියේ නොමග යවනසුළු සම්බන්ධයකි. උද්වේගකර වචන, වෛවර්ණ රූපමය නිරූපණ සහ හැඟීම්බර ඡායාරූප යොදා ගැනීම නිසා තොරතුරු හිඟකම සහ සමාජ විශ්ලේෂණය යටපත් විය. අන්තර්ගතය කොතරම් බැරෑරුම් වුවත් ලේ වැගිරීම් පිළිබඳ විස්තර ඇතුළත් කිරීම, කට වහර යොදා ගැනීම, සුචරිතවාදී ස්වරයකින් අදහස් පළ කිරීම, නාට්‍යමය හා හැඟීම්බර ශෛලියකින් රචනා කිරීම සහ බේදජනක සිදුවීම් අවධාරණය කිරීම පොදු ලක්ෂණ විය.

## උද්වේගකර ශීර්ෂ පාඨ පිළිබඳ උදාහරණ
(සිංහල පුවත්පත්වලින් උපුටා ගන්නා ලදී)

“දහ අට වියැති මව කෑලිවලට කපා මරා දමයි”

“දුම්රිය වේදිකාවේ සිටි තරුණ සුදු කතගේ නිරුවත් දෙපා ලිස්සා ගොස් වේදිකාව සහ දුම්රිය අතර සිර වේ”

“මත් ද්‍රව්‍ය මිල දී ගැනීමට මුදල් නො දුන් නිසා රන් ආභරණ ලබා ගැනීමට අනියම් බිරිඳ ඝාතනය කරලා”

“බිළිඳාට කිරි දෙමින් සිටිය දී අනියම් පෙම්වතා මවගේ ගෙල කපයි”

“ගසක ඇන මරා දමා තිබූ කාන්තාවකගේ සිරුරු කැබලි හැම තැන ම, වසරක් වයසැති ඇගේ දරුවා අගලක”

## ඉතා සුළු දේවල් යොදා ගනිමින් ස්වාභාවික නොවන මරණ පිළිබඳව උද්වේගයක් ඇති කිරීම

බොහෝ විට මරණයට තුඩු දුන් හේතුව ලෙස තනි සහ නොවැදගත් හේතුවක් දැක්වීම නිසා මරණය එම හේතුව මත යුක්ති සහගත විය හැකි අතර එවැනි හේතු පිළිගැනීමට ලක් වන තත්ත්වයට පත් විය හැකි ය.

“උදේ කෑම පමා වුණා ය කියා පුතා පොල්ලකින් පහර දී 73 වියැති අම්මා මරා දමලා”

ශීර්ෂ පාඨවලදී භාෂාව යොදා ගන්නා ආකාරය නිසා ස්වාභාවික නොවන මරණ තව දුරටත් නොවැදගත් තත්ත්වයට පත් වේ.

“තිදරු මව මරා දැමූ දෙදරු පියා පැදුරක නිදා සිටියදී නීතියේ රැහැනට හසු වේ”

“මරණයට පුද්ගලත්වය ආරෝපණය කිරීම (ට්‍රක් මාරයා / ගිනි රකුසා / පුංචි සමනලියා)”

## වක්‍රෝක්තිය

වාර්තාකරණයේ දී (විශේෂයෙන් ම ශීර්ෂ පාඨවලදී) යොදා ගන්නා වක්‍රෝක්තිවලින් බොහෝ විට පුරුෂයන් හා කාන්තාවන් අතර පවත්නා අයථා සම්බන්ධතා ගැන කියැවෙන අතර ලිංගික ඇඟවුම් හා හැඟීම් ඇති වේ. එපමණක් නොව, කාන්තාවන්ගේ හැසිරීම වගකීම් විරහිත බව හෝ ඔවුන්ගේ මරණයට හේතුව ඔවුන් ම බව ඇඟවෙන වක්‍රෝක්ති නිරන්තරයෙන් දක්නට ලැබිණ.

> "තිදරු මව මරා දැමූ දෙදරු පියා පැදුරක නිදා සිටිය දී නිතියේ රැහැනට හසු වේ"
>
> *(වින්දිතභාවයට වූ තැනැත්තිය සහ චූදිත අපරාධකරුවා අතර සම්බන්ධයක් පැවති බව ඇඟවේ)*

> "කිරිකිත්තේ කාමරයක තිබී පිළිස්සුණු කාන්තා සිරුරක් සොයා ගැනේ"
>
> *(ඇයගේ නිදන කාමරය වෙනුවට හෝටල් කාමරයක් ඇඟවේ)*

> "සෙල්ෆි ගනිමින් සිටි චීන කෙල්ල දුම්රියෙන් ඇද වැටී මිය යයි"

> "තාත්තා හැදූ බිත්තිය කඩා වැටී අට හැවිරිදි දරුවා මිය යයි"
>
> *(පෙදරේරුවෙකු නොවේ නම් පියාට බිත්තියක් ඉදි කළ නොහැකි ය)*

සිංහල පුවත්පත් ලිපි බහුතරයක් කාන්තාවන් ගැන සඳහන් කර තිබුණේ (මව්වරුන්, නීත්‍යානුකූල බිරින්දෑවරුන්, දියණිවරුන්, ආත්තම්මලා, අනියම් බිරින්දෑවරුන් යනාදි වශයෙන්) ඔවුන් ඉටු කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකාවන් අනුව ය. එහෙත් ඉංග්‍රීසි පුවත්පත් "කාන්තාව" යන වචනය භාවිත කර ඇත්තේ ස්ත්‍රීන් යන අර්ථයෙන් පමණකි. සමහර අවස්ථාවලදී භාෂාව සහ රූපමය නිරූපණ යන දෙයාකාරයෙන් ම වින්දිතභාවයට පත් වූවන් ලිංගිකත්වය අනුව  වර්ග කරන ලදී. සිදුවීමට සම්බන්ධ තැනැත්තාගේ වයස ද දූ දරුවන් සංඛ්‍යාව ද අනිවාර්යයෙන් ම සඳහන් කර තිබිණි (අදාළ කාන්තාව 86 වියති තැනැත්තියක වුවත් මෙම විස්තර සඳහන් කර තිබිණ). මිය ගිය කාන්තාව ඇයගේ රැකියාව අනුව හඳුනා ගන්නා ලද්දේ අවස්ථා දෙකකදී පමණකි.

## සිංහල පුවත්පත් ආවරණය පිළිබඳ විස්තර කිරීමක්

- වාර්තාවල බොහෝ විට පැවතියේ වර්ණ පසුබිම් මත යොදන ලද පමණට වඩා විශාල, කැපී පෙනෙන මාතෘකා පාඨයන් හෝ උපමාතෘකා පාඨයන් ය. සමහර අවස්ථාවල දී වර්ණ පසුබිම ලිපියේ අවකාශයෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක විහිදී තිබිණ.
- හදිසි අනතුරු පිළිබඳ පුවත් සමග නිතර ම වාහනයේ හෝ වින්දිතභාවයට පත් වූ පුද්ගලයාගේ හැඟීම්බර ඡායාරූපයක් පළ කර තිබිණ.
- වැළපෙන මව්වරුන්, ලේ ගැලීම, සුන්බුන් වූ වාහන සහ වින්දිතභාවයට පත්වුවන්ගේ හා චූදිතයින්ගේ ඡායාරූප අනෙක් රූපමය නිරූපණ විය.

උදාහරණ:



සමාජ වගකීම පිළිබඳ පණිවුඩ ඇතුළත් වූයේ අධ්‍යයන කාල පරිච්ඡේදය තුළ (ලංකාදීප පුවත්පතේ) පළ වී තිබූ ලිපි තුනක පමණකි. (ඒවා සමාජ විරෝධතා සම්බන්ධ සිදුවීම් ආවරණය කළ අතර සිය දිවි නසා ගැනීම් හා මිනීමැරුම් වැළැක්වීමේ පියවරයන් සම්බන්ධයෙන් අභිදේශනයේ යෙදුණේ ය)

පුවත්පත් කලාවේදීන් වින්දිතභාවයට පත් වුවන්ගේ ඥාතීන් සමග සම්මුඛ සාකච්ඡා කර තිබෙන්නේ ඔවුන් මානසික පීඩාවට ලක්ව සිටියදී රැවටීමට ලක් කර බව පෙනෙන්නට තිබේ. වාර්තාකරණයේදී තමන් වැරදි අන්දමින් උපුටා දක්වා ඇතැයි වින්දිතයන්ගේ ඥාතීහු ප්‍රකාශ කළ හ.

## විවාදය

එකිනෙක ගැටෙන අයිතිවාසිකම් හා අවශ්‍යතාවන් නිසා පුවත්පත් වාර්තාකරණය පිළිබඳ විවාදය සංකීර්ණ වී ඇත. සමාජය අන් සියල්ලටමත් වැඩියෙන් සැලකිලිමත් වන්නේ වින්දිතභාවයට පත් වූ පවුල්වලට හැකි උපරිමයෙන් යුක්තිය ඉටු කර දෙන බවත් අපරාධකරුවන්ට දඬුවම් පමුණුවන බවත් සහතික කිරීම ගැනයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මරණයට පත් වූ විට පවා වින්දිතයන්ගේ (සහ ඔවුන්ගේ පවුල්වල) අනන්‍යතාව, කීර්තිය හා අභිමානය ආරක්ෂා කිරීම සඳහා ආචාර ධාර්මික සුරක්ෂාවන් තහවුරු කරනු ලැබ ඇත.

ශ්‍රී ලාංකික නීතිය අනුව නිශ්චිත වශයෙන් සඳහන් කර තිබෙන අවස්ථාවලදී හැර වින්දිතයන්ගේ හා ඥාතීන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කළ යුතු යැයි අපේක්ෂිත ය. එහෙත් පුවත්පත්වලට පුවත්පත් කලාවේදීමය උපමානයක් ලෙස සලකා වින්දිතභාවයට පත්වූවන්ගේ, ඔවුන්ගේ පවුල්වල සහ චූදිත අපරාධකරුවන්ගේ අනන්‍යතාව හෙළි කිරීමට ඉඩ සැලසෙන ව්‍යතිරේඛ පවතී. එපමණක් නොව, පුවත්පත් (මෙන් ම ප්‍රධාන ප්‍රවාහයේ මාධ්‍ය සහ සමාජ මාධ්‍ය අතර) පවත්නා තියුණු තරගය වගකීම් විරහිත හා ආචාර ධාර්මානුකූල නොවන වාර්තාකරණයට වැඩි වැඩියෙන් හේතු වී ඇති බවට තර්ක කරනු ලැබේ. උදාහරණයක් ලෙස, වින්දිතභාවයට පත් වූ කාන්තාවන් ඍණාත්මක ආකාරයෙන් නිරූපණය කෙරෙන අතර ලිපිවල ප්‍රධාන අරමුණ වන්නේ සත්‍ය කරුණු ඉදිරිපත් කිරීම වෙනුවට උද්වේගය ඇති කිරීම බව පෙනී යයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, කාන්තාවන්ගේ අයිතිවාසිකම්, වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ චූදිතයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ගැටලු ආදිය මතු වී ඇත. එපමණක් නොව, විශේෂයෙන් ම පුවත්පත් ඇතුළු මාධ්‍යයේ කාර්යභාරය විය යුත්තේ ප්‍රචණ්ඩත්වය අඛණ්ඩව විවාදයට ලක් වන ආකාරයට මිනිස් චර්යාවන්ට බලපෑම් කිරීමයි.

එමෙන්ම, මහජනතාවට පුවත් දැන ගැනීමේ අයිතිය පවතී. පුළුල් සහ අඛණ්ඩ මාධ්‍ය ආවරණය නිසා මෙම සිදුවීම්වලට අදාළ නීතිමය ක්‍රියාවලි සමහරක් කඩිනම් වන්නට ද ඉඩ ඇත. කෙසේ වුව ද, පුවත්පත් විසින් පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය ආක්‍රමණය කිරීම සිදු විය යුත්තේ අනිසි කුතුහලය නිසා නොව අව්‍යාජ මහජන යහපත පිණිස යැයි (උදාහරණයක් ලෙස ඉන්දියාවේ පුවත්පත් මණ්ඩලය විසින්) තර්ක කරනු ලැබ ඇත. අනෙක් අතට, සමහර කාරණා තවමත් අධිකරණයේ ඔප්පු වී නැති අතර යම් කාරණාවක් ප්‍රසිද්ධ වාර්තා ගණයට වැටෙන විට පමණක් පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය යටපත් වේ.

උපකොටස (1) යටතේ සම්පාදනය වන රැකවරණයට හා සහායට මේවා ඇතුළත් විය හැකි යː-

නිසි පියවර ගැනීමෙන් එවැනි අපරාධයකට වින්දිත වූ පුද්ගලයාගේ හෝ සාක්ෂිකරුවාගේ අනන්‍යතාව සහ සාක්ෂි ප්‍රකාශය සමස්තයක් ලෙස හෝ ඉන් කොටසක් අදාළ චූදිතයා සහ ඔහුගේ නීතිමය නියෝජිතයා හැර වෙනත් පුද්ගලයන්ට අනාවරණය වීම වැළකිය හැකි ය.

අපරාධයට බඳුන් වූ තැනැත්තාගේ හෝ අදාළ සාක්ෂිකරුවාගේ අනන්‍යතාවට අදාළ තොරතුරු මුද්‍රණයෙන් එළි දක්වන, ගුවන් විදුලියෙන් හෝ රූපවාහිනියෙන් විකාශය කරන හෝ වෙනත් ආකාරයකින් ප්‍රචලිත කරන මාධ්‍ය ආයතන, මාධ්‍ය කාර්ය මණ්ඩල සහ වෙනත් විශේෂිත පුද්ගලයන් හැසිරවීමේ බලය ද ඉහත කී පියවර අතරට ඇතුළත් විය යුතු ය.

**2015 අංක 4 දරන අපරාධ වින්දිතයින් සහ සාක්ෂිකරුවන්ට සහාය වීම සහ ඔවුන් ආරක්ෂා කිරීම පිළිබඳ පනත.**

## මාධ්‍යයේ වගකීම

- මානසික පීඩාවට පත්ව සිටින අතරතුර කඩා වැදී ශෝකය තමන්ගේ වාසියට යොදා ගැනීම ආචාරධාර්මානුකූල ගැටලුවකි. පීඩාවට පත්ව සිටින කාල පරිච්ඡේදය තුළදී සහ රැවටීමට ලක් කිරීම ඔස්සේ පවුලේ සාමාජිකයන් සම්මුඛ සාකච්ඡාවට ලක් කිරීමෙන් වැළකිය යුතු ය.

- පවුල් කම්පාවට පත්ව මානසික කම්පනය අත්දකිමින් සිටිනවා විය හැකි බව මතක තබා ගන්න. සෘජු හෝ වක්‍ර සඳහන් කිරීම් හෝ විස්තර මගින් වින්දිතයන්, අපරාධකරුවන් හා ඔවුන්ගේ පවුල් හඳුන්වා දීමෙන් වැළකිය යුතු ය (නම් සහ ලිපින සම්පාදනය නොකළ යුතු ය).

- විශේෂයෙන් ම, විමර්ශනය සාර්ථක ලෙස කරගෙන යාමට හැකි වන පරිදි පොලීසිය සැකකරුවන් හඳුනා ගෙන ඇති බව ඇඟවීමේ භාවිතාවන්ගෙන් වැළකිය යුතු ය.

- අධිකරණ වෛද්‍ය නිගමනය ලැබෙන්නට පෙර සිදුවීම අනුමානයෙන් ගොඩ නැගීමෙන් වැළකිය යුතු ය. එසේ කළ හොත් විමර්ශනයට බාධා වී ව්‍යාකූලත්වයකට තුඩු දිය හැකි ය.

- පවුලේ සාමාජිකයන් අත්විඳින පීඩාව උග්‍ර වීමට තුඩු දිය හැකි හෙයින් වාර්තාකරණයේදී (මෙන් ම ශීර්ෂ පාඨවලදී ද) වින්දිතයන්ගේ ලිංගික හැසිරීම ගැන වක්‍රෝක්තියෙන් සඳහන් කිරීමෙන් වළකින්න.

- පුවත්පත් වාර්තාකරණයේදී 'අනර්ථයක් නො කිරීමේ' මූලධර්මය පිළිපදින්න. සම්මුඛ සාකච්ඡාවට ලක් කෙරෙන පුද්ගලයන් පවසන වචන වැරදි අන්දමින් උපුටා දැක්වීම හෝ විකෘති කිරීම හෝ වරදවා අර්ථ නිරූපණය කිරීම නො කරන්න.

- නො ගැඹුරු පුවත් ආවරණය නිසා අවදානමට පත් වන්නට ඉඩ තිබෙන පුද්ගලයන් සිටිය හැකි බව සිත තබා ගන්න. ස්වාභාවික නොවන මරණ ගැන අනුමානයෙන් කල්පනා කිරීම සහ මරණයට හේතුව සුළු කොට තැකීම නො කරන්න.

- පිළිගත් ආචාරධර්මානුකූල භාවිතයන්ට අනුකූලව කටයුතු කරමින්, චෝදනා කිරීම් ඇතුළත් වන පුවත්පත් සිරස්තල/අන්තර්ගතයන් විරාම ලකුණු යොදා හඳුනා ගත හැකි ලෙස දක්වන බව සහතික කරන්න.

- වෙනසක් කරන්න. උපදේශන මධ්‍යස්ථාන, නීතිමය සහන සේවා, සහායක කණ්ඩායම්, ක්ෂණික දුරකථන අංක හා උදව් දුරකථන අංක යනාදී උපකාරක ක්‍රම හා සම්පත් පවත්නා බව ගැන මහජනතාව දැනුවත් කරන්න.

- ස්වාභාවික නොවන මරණ සෘණාත්මක ආකාරයෙන් ආවරණය කිරීම නිසා වින්දිතභාවයට පත්වීමට ඉඩ ඇති ජනයා සිටිය හැකි බව මතක තබා ගන්න. හදිසි අනතුරු සහ සිය දිවි නසා ගැනීම් වාර්තා කරන විට ඒවා වැළැක්වීම සම්බන්ධ පණිවුඩ ඇතුළත් කරන්න.

- වැළැක්වීම, රැකවරණය සැපයීම, සහන සැලසීම සහ මිනීමැරුම්වලින් ආරක්ෂා කිරීම සම්බන්ධ පණිවුඩ ප්‍රසිද්ධ කරන්න.

- අන් සියල්ලටමත් වඩා, විශිෂ්ට පුවත්පත් කලාවේදියෙකු වීමට පරිශ්‍රම දරන්න.

## නීති සහ ප්‍රතිපත්ති

- සංවේදී සහ වගකීම් සහගත මාධ්‍ය ආවරණය පිළිබඳව ලෝකය පුරා ම නව වර්ධනයන් දැක ගත හැකි ය. සිය දිවි නසා ගැනීම්, මිනීමැරුම් හා හදිසි අනතුරු පිළිබඳ නව ආචාරධර්මානුකූල මාර්ගෝපදේශ ගැන දැනුවත් වන්න.

- මාධ්‍ය ආයතන තුළ ආචාරධර්මානුකූල පුවත්පත් වාර්තාකරණයට අදාළ මාර්ගෝපදේශ සකස් කරන්න /ක්‍රියාත්මක කරන්න.

- පොලීසිය සහ අධිකරණ පද්ධතිය පුවත්පත් වාර්තාකරණයට අදාළව පවත්නා නීති ක්‍රියාත්මක කිරීම සහ ඒවාට අනුකූලව කටයුතු කිරීම සිදු කළ යුතු ය.

- පුවත්පත් පැමිණිලි කොමිසම, කර්තෘ සංසදය, ශ්‍රී ලංකා වෘත්තීය පුවත්පත් කලාවේදීන්ගේ සංගමය යනාදිය ආචාරධර්මානුකූල පුවත්පත් කලාවේදයේ මග ගන්නා බව සහතික කරන්න.

## ගෞරවනීය හා සංවේදී වාර්තාකරණය

- පුවත්පත් ආයතන අතර දැඩි තරගයක් තිබුණත් ස්වාභාවික මරණ සම්බන්ධයෙන් උද්වේගකර හා ප්‍රකෝපකාරී ශීර්ෂ පාඨ යොදා ගැනීමෙන් වළකින්න.

- පුවත් අන්තර්ගතයෙන් පුවතේ සිරස්තලය යුක්ති සහගත වන බවට සහතික වන්න. එලෙස පුවත්පතේ වෘත්තිකභාවය ආරක්ෂා කරන්න.

- සෘණාත්මක ආවරණය නිසා මරණයෙන් ශෝකයට පත් වූවන් විශේෂයෙන් ම පීඩාවට පත් විය හැකි ය. කපා කොටා දමන ලද මළ සිරුරුවල ඡායාරූප හෝ භීෂණය හෝ පිළිකුල ඇති වන හෝ වාර්ගික වෛරයට තුඩු දිය හැකි වෙනත් ඡායාරූප පළ කිරීමෙන් වළකින්න.

- පුවත්පත් පිටු හා රූපමය නිරූපණ සැලසුම් කරන විට උද්වේගය දැනවෙන ආකාරයෙන් එය කිරීමෙන් වළකින්න. එය ස්වාභාවික නොවන මරණ උත්කර්ෂයට නැංවීමට පහසුවෙන් ම තුඩු දිය හැකි ය.

- මාධ්‍යය තුළ ප්‍රචණ්ඩත්වය උද්වේගකර ආකාරයෙන් වාර්තාකරනු ලැබීම නිසා ඊට සමාන ප්‍රචණ්ඩත්වයන් දිගින් දිගට ම ඇති වීමට බොහෝ දුරට ඉඩකඩ ඇත. උද්වේගකර වීමෙන් වළකින්න. එනම්:

    - නාට්‍යමය හා ඛේදජනක සිදුවීම අවධාරණය කර හැඟීම් ඇවිස්සීමෙන් වළකින්න,

    - රූපමය නිරූපණ හා භාවාතිශය විස්තර අතිශයෝක්තියට නගා උත්කර්ෂයට නැංවීමෙන් වළකින්න,

    - නො වැදගත් තොරතුරු අවධාරණය කර ඒවා වැදගත් තොරතුරු බවට පත් කිරීමෙන් වළකින්න,

    - අවිනීත කට වහර යොදා ගැනීමෙන් වළකින්න,

- සිදුවීම් හෝ අදාළ පුද්ගලයන් සම්බන්ධයෙන් සාවද්‍ය වැටහීමක් ඇති වන වක්‍රෝක්ති භාවිතයෙන් වළකින්න, සහ

- වින්දිතභාවයට පත්වූවන්ගේ ලිංගික වෙනස්කම් හුවා දැක්වීම සහ ඔවුන් පිළිබඳ ලිංගික තොරතුරු ප්‍රසිද්ධ කිරීමෙන් වළකින්න.

- ලිපි හා සම්මුඛ සාකච්ඡාවලදී ප්‍රචණ්ඩ ක්‍රියා, සොරකම් හා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සහ ඒවාට සම්බන්ධ අපරාධකරුවන් උත්කර්ෂයට නැංවීමෙන් වැළකීම ද වැදගත් වේ.

- යහපත් මහජන රුචිකත්වය කෙලෙසන අසභ්‍ය, ග්‍රාම්‍ය හෝ ආක්‍රමණකාරී වාර්තාකරණයෙන් වැළකී උසස් පුවත්පත් කලාවේදී ප්‍රමිතීන් ක්‍රියාකාරීව ආරක්ෂා කරන්න.

- පිරිමින් සහ කාන්තාවන් පිළිබඳ ගතානුගතික අදහස් ඉදිරිපත් වන සඳහන් කිරීම් හා ඡායාරූප යොදා ගැනීමෙන් වළකින්න. එම පියවර නිසා වාර්තාකරණයට වැඩි ගැඹුරක් ලැබෙනු ඇත.

- මහජනයා යනු සංකීර්ණ ප්‍රජාවකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකාවන්, වයස, සම්බන්ධතා සහ පවුලේ තොරතුරු පදනම් කර ගෙන පිරිමින් හා කාන්තාවන් හඳුන්වා දීමෙන් වළකින්න.

- යහපත් පුවත්පත් කලාව ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදී විය යුතු ය. වගකීම් විරහිත හැසිරීම කාන්තාවන්ගේ ගති ලක්ෂණයක් බවට පත් කිරීමෙන් හෝ තමන්ගේ මරණවලට වගකිව යුත්තේ වින්දිතයන් ම බව වක්‍රව ඇඟවීමෙන් වළකින්න.

## අධ්‍යාපනික

- ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම, කර්තෘ සංසදය වැනි නිරීක්ෂණ ආයතන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාව ද ඇතුළු සංවේදී, වගකීම් සහගත හා ආචාරධර්මානුකූල පුවත්පත් වාර්තාකරණය සම්බන්ධයෙන් පුවත්පත් කලාවේදීන්ට පුහුණුව හා නැවත පුහුණුව ලබා දෙන බව සහතික කරන්න.

- අදාළ නීති ගැන සහ මාධ්‍ය අන්තර් ක්‍රියාකාරීත්වයන් ගැන පොලිස් නිලධාරීන්ට පුහුණුව හා නැවත පුහුණුව ලබා දෙන්න.

- සෑම මට්ටමකදී ම පුවත්පත් කලාවේදී පාඨමාලාවන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආචාරධර්ම සහ මාධ්‍යයේ වගකීම වැනි මාතෘකා ඇතුළත් කරන්න.

## ප්‍රධාන පාර්ශ්වකරුවන්

- රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය ආයතන
- පුවත්පත් ආයතනවල අයිතිකරුවන්
- කර්තෘවරුන් සහ උපකර්තෘවරුන්
- අධිකරණ වාර්තාකරුවන් / පළාත් සහ ප්‍රාදේශීය වාර්තාකරුවන්
- වෘත්තීය සංසද (කර්තෘවරුන්ගේ, වාර්තාකරුවන්ගේ, පුවත්පත් අයිතිකරුවන්ගේ)
- පුවත්පත් කලාවේදී පාඨමාලාවන්හි ගුරුවරුන්
- මාධ්‍ය අමාත්‍යාංශය
- නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
- අපරාධවල වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය
- පොලිස් විමර්ශන නිලධාරීන්
- අධිකරණ වෛද්‍ය විශේෂඥයන්
- විනිශ්චයකාරවරුන්
- නීතිඥයන්

## පුවත්පත් වාර්තාකරණය පිළිබඳ නීති හා ප්‍රතිපත්ති

- දණ්ඩ නීති සංග්‍රහය

- 2015 අංක 4 දරන අපරාධ වින්දිතයින් සහ සාක්ෂිකරුවන්ට සහාය වීම හා ඔවුන් ආරක්ෂා කිරීම පිළිබඳ පනත.

- වෘත්තීය භාවිතය ආශ්‍රිත ආචාරධර්ම පද්ධතිය - ශ්‍රී ලංකා කර්තෘ සංසදය

- පුවත්පත් කලාවේදී ආචාරධර්ම පද්ධතියේ ඇතුළත් නීති රීති - ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

- තොරතුරු දැන ගැනීමේ අයිතිය.

## පුවත්පත් වාර්තාකරණය පිළිබඳ මාර්ගෝපදේශ

- ළමා වින්දිතයින් සහ අපරාධ යුක්ති ක්‍රියාවලියට සම්බන්ධිත ළමයින් සම්බන්ධ කරුණු වාර්තා කරන මාධ්‍ය කාර්ය මාණ්ඩලිකයන් සඳහා මාර්ගෝපදේශ (ළමා ආරක්ෂණ අධිකාරිය)

- ළමා අපයෝජනය කළමනාකරණය කිරීම සහ බහුආංශික ප්‍රවිෂ්ටයන් නොසලකා හැරීම සඳහා ජාතික මාර්ගෝපදේශකයෙහි ඇතුළත් ළමා අපයෝජනය පිළිබඳ වාර්තාකරණය (පුවත්පත් කලාවේදී අත්පොත - ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය)

- ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් සම්මත කරන ලද ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය භාවිතය පිළිබඳ ආචාරධර්ම පද්ධතිය

## කර්තෘ සහ ප්‍රධාන විමර්ශක

මහාචාර්ය අනුරුද්ධි එදිරිසිංහ

## කර්තෘන් සහ පර්යේෂකයින්

මහාචාර්ය අනුරුද්ධි එදිරිසිංහ | මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ | මහාචාර්ය ඉන්දිරා කිතුල්වත්ත | ආචාර්ය අනූශා එදිරිසිංහ ද ආචාර්ය උදාර සේනාරත්න | ආචාර්ය හඳුන් විජේවර්ධන | මහාචාර්ය | ආචාර්ය ෂී පරනිතරන් | ආචාර්ය අන්නිස්ටා විජේනායක | ආචාර්ය නිර්මල පෙරේරා | මහාචාර්ය අස්විනී ප්‍රනාන්දු | ආචාර්ය දිලිනි වලිසුන්දර

## දත්ත රැස්කිරීමේ අධීක්ෂණ කණ්ඩායම (ප්‍රමාණාත්මක අංගයන්)

මහාචාර්ය අනුරුද්ධි එදිරිසිංහ | ආචාර්ය අනූශා එදිරිසිංහ | ආචාර්ය උදාර සේනාරත්න | ආචාර්ය හඳුන් විජේවර්ධන

## දත්ත රැස්කිරීමේ අධීක්ෂණ කණ්ඩායම (ගුණාත්මක අංගයන්)

මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ | ආචාර්ය අනූශා එදිරිසිංහ | මහාචාර්ය අනුරුද්ධි එදිරිසිංහ | ආචාර්ය උදාර සේනාරත්න | ආචාර්ය හඳුන් විජේවර්ධන

## දත්ත රැස්කිරීමේ කණ්ඩායම (ප්‍රමාණාත්මක හා ගුණාත්මක)

සඳරු ජයරත්න මයා | සුරාජ් ජයරත්න මයා | අචාර්ය පබසරා විජයරත්න | ආචාර්ය සජිනි හේරත් | ආචාර්ය භාෂන්ත ජයවීර | සමින්දි හේවාගමගේ මැය | ආචාර්ය හජමුගි තමිලවානන් | එනී තමිල්වානන් මයා | ආචාර්ය මාලිත හේවගේ | ආචාර්ය අමල්කා පත්මපෙරුම | ආචාර්ය කුමාර සේනානායක

**‘ජනගහණ සංකථන’** යනු ශ්‍රී ලංකාවේ
මතු වෙමින් තිබෙන සමාජ දේශපාලන
කාරණා පිළිබඳ විශ්ලේෂණාත්මක
ප්‍රතිපත්ති සාරාංශ මාලාවකි.

**එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල**
202, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7, ශ්‍රී ලංකාව

දුරකථනය: +94 (011) 2580840

/unfpa.srilanka @unfpasrilanka @unfpasrilanka srilanka.unfpa.org